රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 14/2014

මගේ අංකය: EST-8/ALOWN/06/0719/25(IV)G
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.05.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## මූලික විමර්ශන සඳහා ගෙවීම්

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තියේ විධිවිධාන පරිදි මූලික විමර්ශනයක් සඳහා පත්කරනු ලබන නිලධරයකුට 2014.06.01 දින සිට මෙම චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් පරිදි දීමනා ගෙවිය හැකිය.

03.

| ඉටු කරන කාර්යය | දීමනාව | |
|---|---|---|
| | ද්විතීය/ තෘතීය මට්ටමේ නිලධරයකු | විධායක/ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ නිලධරයකු |
| මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කිරීම | රු.1500/- | රු.2000/- |
| චෝදනා පත්‍ර කෙටුම්පත් පිළියෙල කර ඉදිරිපත් කිරීම | රු. 500/- | රු. 500/- |

04. මූලික විමර්ශන නිලධරයකු විසින් මෙහි ඇමුණුම I හි දැක්වෙන ආකෘතියට අනුව ජ'නලයක් නඩත්තු කළ යුතු අතර එම ජ'නලය අවසන් වාර්තාව සමඟ අදාළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉහත 03 ඡේදයෙහි සඳහන් දීමනා ලබා ගැනීමට මෙම ජ'නලය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. කිසියම් මූලික විමර්ශනයක් සඳහා එක් නිලධරයකු වෙනුවට කමිටුවක් පත්කරන ලද්දේ නම් කමිටුවේ එක් එක් සාමාජිකයා වෙන් වෙන් වශයෙන් මෙම ජ'නලය නඩත්තු කළ යුතුය. එසේම කමිටුවේ සාමාජිකයින්ට වෙන් වෙන් වශයෙන් ඉහත 03 ඡේදයේ සඳහන් දීමනා ලබා ගැනීමට ද හිමිකම ඇත.

05. ඉහත දීමනාවට අමතරව මූලික විමර්ශන නිලධරයකුට ඔහු රජයේ සේවයේ දරන තනතුර පදනම් කරගෙන ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබාගැනීමට හිමිකම් ඇත.

06. ඉහත 03 ඡේදයෙහි දීමනා ලබාගැනීමට නම් මූලික විමර්ශනය සඳහා නියම කර ඇති කාල සීමාව තුළ එකී පරීක්ෂණය අවසන් කර තිබිය යුතු අතර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ කරන්නේනම් චෝදනා පත්‍ර කෙටුම්පත නිම කර භාර දීම ද එම කාල සීමාව තුළම සිදු කර තිබිය යුතුය. මූලික විමර්ශනය සඳහා දින නියම කිරීමේ දී සිද්ධිය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සාධාරණ කාලයක් මූලික විමර්ශන නිලධරයා වෙත ලබා දීමට අදාළ බලධරයන් කටයුතු කළ යුතුය.

07. මූලික විමර්ශන නිලධරයා හෝ කමිටුව නිසි කාල කළමනාකරණයකින් යුතුව මූලික විමර්ශනයට දී ඇති කාලය තුළ එය කඩිනමින් නිම කළ යුතුය. කිසියම් හේතුවක් නිසා මූලික විමර්ශනයක් ලබා දුන් කාලයට වඩා ප්‍රමාද වූයේ නම් එවැනි මූලික විමර්ශන සඳහා පහත පරිදි දීමනා ලබාදිය හැකි වේ.

| නියමිත දිනට වඩා ප්‍රමාද වූ කාලය | 3 ඡේදයේ සඳහන් දීමනාවෙන් ගෙවිය යුතු ප්‍රතිශතය |
|---|---|
| මාසයක් හෝ ඊට අඩු | 75% |
| මාසයකට වැඩි මාස 02ක් හෝ ඊට අඩු | 60% |
| මාස 02 කට වැඩි මාස 03ක් හෝ ඊට අඩු | 50% |

08. මාස 03කට වඩා කල් පසු වී බාර දෙන මූලික විමර්ශන වාර්තා සඳහා දීමනා ගෙවනු නොලැබේ.

09. මූලික විමර්ශන නිලධරයකු වෙත හෝ කමිටුවක් වෙත ඉහත 03 ඡේදයට අදාළ ගෙවීම් කිරීමට පෙර ඉදිරිපත් කර ඇති මූලික විමර්ශන වාර්තාවේ ගුණාත්මකභාවය පිළිබඳව ද අදාළ බලධරයන් විසින් අවධානය යොමු කළ යුතු බව අවධාරණය කරමි.

10. නිත්‍ය රාජකාරි වශයෙන් විමර්ශන කටයුතු පවරා ඇති නිලධරයන්ට ඔවුන්ගේ නිත්‍ය රාජකාරි යටතට ගැනෙන විමර්ශනයන් සඳහා ඉහත 03 ඡේදයේ සඳහන් දීමනා හිමි නොවේ.

11. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

(signature)

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**ඇමුණුම - I**

**<u>මූලික විමර්ශන නිලධරයකු විසින් පවත්වා ගත යුතු ජ'නලය</u>**

මූලික විමර්ශනය සිදු කරන නිලධරයාගේ නම :-

මූලික විමර්ශන නිලධරයාගේ නිත්‍ය තනතුර :-

සේවයකට අයත්වන්නේ නම් සේවය :-

වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප :-

සම්බන්ධ කරගත හැකි දුරකථන අංක

ජංගම :-

කාර්යාලය :-

නිවස :-

මූලික විමර්ශනය සඳහා පත් කිරීමේ යොමුව :-

සිද්ධියට අදාළ ආයතනය :-

ප්‍රධාන කාර්යාලයේ නොවන්නේ නම්
අදාළ සිද්ධිය සිදු වූ උප කාර්යාලය :-

| දිනය | ආරම්භක වේලාව | අවසන් කරන ලද වේලාව | ඉටු කරන ලද කාර්යය (භාණ්ඩ / මුදල් පරීක්ෂා කිරීම, ලේඛන පරීක්ෂා කිරීම, සාක්ෂි සටහන් කර ගැනීම) | මුදල්/භාණ්ඩ/ලේඛන භාරව සිටි අයගේ අත්සන හෝ සාක්ෂි ලබා දුන් අයගේ අත්සන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

ඉහත වේලාවන්හි දී ඉහත සඳහන් කාර්යයන්වල නිරත වූ බව ප්‍රකාශ කර සිටිමි.

............. ......................................................

දිනය මූලික විමර්ශන නිලධරයාගේ අත්සන